සියලු ම හිමිකම් ඇවිරිණි.


රහස්‍ය ලේඛනයකි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2023 (2024)

# 47 - සිංහල සාහිත්‍ය රසාස්වාදය

## ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත් වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතු ව ඇත.

# අ.පො.ස. (සා.පෙළ) විභාගය 2023 (2024)

## 47 - සිංහල සාහිත්‍ය රසාස්වාදය

### ලකුණු දීමේ පටිපාටිය

I පත්‍රය - 1, 2 ප්‍රශ්න අනිවාර්ය වේ

II පත්‍රය - 1 ප්‍රශ්නය අනිවාර්ය වේ

- 2,3,4,5 ප්‍රශ්නවලින් තෝරා ගත් ප්‍රශ්න 02ක් පමණයි

| | | | | |
|---|---|---|---|---|
| I පත්‍රය | - | 1 ප්‍රශ්නයට | - | ලකුණු 20 |
| | | 2 ප්‍රශ්නයට | - | ලකුණු 20 |
| | | | | ලකුණු 40 |

II පත්‍රය - 1 ප්‍රශ්නයට - ලකුණු 30

II පත්‍රය - එක් ප්‍රශ්නයකට 15 බැගින් ප්‍රශ්න 02කට - ලකුණු 30

| | | | | |
|---|---|---|---|---|
| මුළු ලකුණු | - | I පත්‍රය | - | ලකුණු 40 |
| | | II පත්‍රය (I ප්‍රශ්නය) | - | ලකුණු 30 |
| | | 15 බැගින් ප්‍රශ්න 02කට | - | ලකුණු 30 |
| | | | | ලකුණු 100 |

## සිංහල සාහිත්‍ය රසාස්වාදය - I පත්‍රය

(සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.)

1. (i) සිට (v) තෙක් ඇති කොටස් කියවා, ඒවා ඇසුරෙන් අසා ඇති (අ), (ආ) ප්‍රශ්නවලට **කෙටි පිළිතුරු** දී ඇති හිස්තැන්වල පමණක් ලියන්න.

(i) "උන් මහණ වූ ශෝකය අතිස් සන්හිඳුවන්නෝ කවුරු ද?"

(අ) මෙම ප්‍රකාශය කළේ කවරෙක් ද?

සුදොවුන් මහරජතුමා / සුද්ධෝදන රජතුමා / නන්ද තෙරුන්ගේ පියා /සිදුහත් කුමරුගේ පියා / බුදුන් වහන්සේගේ පියා

(ආ) මෙම ප්‍රකාශය ඇතුළත් කෘතියේ කතුවරයා කවරෙක් ද?

ධර්මසේන හිමි

(ii) "පියරු දැම්මට මූහුණේ ගඳ යනවා ද?"

(අ) මෙම ප්‍රකාශය කළේ කවුද?

වෙසක් පහන කෙටිකතාවේ කථකයා/ මල්ලි

(ආ) මෙම ප්‍රකාශය කළේ කාහට ද?

නංගීට /ඔහුගේ නංගීට / කථකයාගේ නංගීට

(iii) නොහිමි ම් සුවඳ විහිදෙන කස්තුරි    නිඹු ල
උකු ම් මුව නැබෙහි තැබී බඹ නැණ    විකල
වී න ම් මෙමට මහ බඹු පදවි යම්    ක ල
තබ ම් බොරු කියන දුදනන්ගේ දිව    මු ල

(අ) මෙහි අවසන් කවි පද දෙකෙහි අදහස ලියන්න.

යම් කලෙක මට මහා බ්‍රහ්ම පදවිය ලැබුණොත් (එම කස්තුරි) බොරු බස් කියන

අසත්පුරුෂයන්ගේ දිව මුල තබමි.

(ආ) තද කළු අකුරෙන් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.

**නොහිමි** සීමාවක් නැති / අප්‍රමාණ

**නැබෙහි** නාභියෙහි , පෙකණියෙහි, බුරියෙහි

(iv) "මෙයා ආසාවෙ දඟලන්නෙ ටැක්නිකල් කොලීජියටනේ. එහාට ම යවනව"

(අ) මෙම ප්‍රකාශය ඇතුළත් කෘතියේ කතුවරයා කවරෙක් ද?

මහගම සේකර

(ආ) "මෙයා" යනුවෙන් මෙහි හඳුන්වා ඇත්තේ කවරෙක් ද?

සිරිසේන / පුතා / කථකයා

[තුන්වැනි පිටුව බලන්න.

(v) බඩගිනි වෙලා මම ගිය කල පුතුගෙ          ගෙ ට
මැනලා වී දෙකක් දුන්නයි මල්ලක          ට
ගන්දෝ නොගන්දෝ කියලා සිතුණි          ම ට
මැනල ද පුතේ සිරි දුන්නෙ මං          නුඹ ට

(අ) මෙම කවිය කවුරුන් විසින් කියන ලද්දක් ද?

අම්මා කෙනෙකු විසින් / මවක විසින්

(ආ) මෙම කවියෙන් කියවෙන්නේ කුමන අවස්ථාවක් පිළිබඳ ව ද?

මවකු, සිය කුසගිනි නිවා ගැනීම සඳහා කෑමට යමක් සොයා තම පුතු ගේ නිවසට ගිය අවස්ථාව

(ලකුණු 04 × 5 = 20යි)          20

2. පහත දැක්වෙන ගද්‍ය-පද්‍ය කොටස් දෙකෙන් **එක්** කොටසකට **පමණක්** පිළිතුරු සපයන්න.

එසඳ ප්‍රභාවතීන් වතුර කළ ගෙනෙන බෝධිසත්ත්වයන් දැක මුන් වහන්සේ තමන් වහන්සේට නුසුදුසු වූ වහල් කළමනා දෙය කරන සේක. ඉදින් මම දවස් ගණනක් බැණ නො නැඟී උනිම නම් මූ මා කැමැත්තෝ වනැයි සිතා අන් තැනකට නො ගොස් මා දැක දැක මෙහි වාසය කරන සේක. එසේ නො කොට මෙහි ඇසිල්ලකුත් නො රඳා යන සැටියේ බැණ දොඩා නික්මවමි සිතා දොර අඩවල කොට ගෙතුළෙහි එක් අතකින් දොර අල්වා ගෙන අගුළු කනුවේ වැතිර සිට "කුස රජ්ජුරුවන් වහන්ස, මෙබඳු වූ කාරියක් ඉදින් ජීවිතය ගෙ නමුත් නො කරන සේක. එතකුදු වුවත් මා නිසා උදාසනය සවසය මධ්‍යම රාත්‍රිය මධ්‍යාහ්නය යන විභාගයක් නැතිව දිය දර සැපයීම පිසීම් කැටීම් පෙවීම් ආදි හීනක්‍රියාවෙන් හා දුර්භෝජන දුක්ඛසෙය්‍යාවෙන් දවස් යවමින් මෙහි සිට දුක් නො විඳ නුඹ වහන්සේගේ කුසාවතී නුවරට නැඟී ගොස් මා කෙරෙහි සිහිවිල්ලක් නො සිතා නුඹ වහන්සේ වැනි සකුරු පුවක් සේ දාහැලී ගිය මුහුණු ඇති යක්ෂිනක අගමෙහෙසුන් කොට ගෙන රාජ්‍යය කළ මැනව. ඉදින් විරූප වූ නුඹ වහන්සේ කෙතෙක් කල් මී ඉඳ දුක් උණත් මම නො කැමැත්තෙමි, නො රඳා වහා නික්මුණු මැනව" යි කීවු ය. එකල්හි මහාබෝධිසත්ත්වයෝ ප්‍රභාවතීන්ගෙන් මෙවිවර කථා සම්භාෂණයක් ලදිමියි සතුටුව "මුවපොල්ලන්ට බඳු වූ ඇස් ඇති හේමාභරණ විභූෂිත ගාත්‍රා ඇති මහා වූ කටි ප්‍රදේශ ඇති රත්කමින් විසිතුරු වූ වස්ත්‍රයෙන් ශෝභමාන වූ දේහ ඇති ප්‍රභාවතීනි, තොපගේ රූප සෞන්දර්යයෙන් පැහැර ගන්නා ලද සිත් ඇති ක්ලේශාන්ධකාරයෙන් වසන ලදුව දික්විභාගයෙහි අසමර්ථ හෙයින් කුසාවතී නම් රාජධානියට යා නොහැකිමි. ඒ රාජශ්‍රීයෙන් මට ප්‍රයෝජන නැත්තේ ය. මෙරට ම වාසය කරමි" කීහ.

බෝධිසත්ත්වයන් විසින් මෙලෙස කී කල්හි මූ විපිළිසරව නැඟී යෙති, පරිභව කොට කියමින් සිටිය දී ම මා කෙරෙහි ඇලී ම කරා කෙරෙති, ඉදින් මූ මම කුසරජ යයි අවුත් මා අත අල්වා ගත්තු නම් කවුරු වළකත් දැයි ගෙට වැද දොර අගුළු ලා ගත්තු ය.

(i) මෙම පාඨයෙහි ඇතුළත් උපමා **දෙකක්** උපුටා දක්වන්න.

- සකුරු පුවක් සේ
- මුවපොල්ලන්ට බඳු වූ

(ලකුණු 04යි)

[හතරවැනි පිටුව බලන්න.

(ii) "ඉදින් මම දවස් ගණනක් බැණ නො නැගී උනිමි නම් මූ මා කැමැත්තෝ වනැයි සිතා අන් තැනකට නොගොස් මා දැක දැක මෙහි වාසය කරන සේක." මෙම පාඨයෙහි අර්ථය ලියන්න.

ඉතින් මම දවස් කිහිපයක් කතා නොකර සිටියහොත් මොහු මා කැමැත්තෙන් සිටී යයි සිතා වෙනත් තැනකට නොගොස් මා දකිමින් මෙහි ම වාසය කරයි.

(ලකුණු 04යි)

(iii) කුස රජතුමා සාගල නුවරින් පිටමං කිරීමට පබාවතිය ගත් උත්සාහය පැහැදිලි කරන්න.

- කුස රජතුමා තමන්ට නොතරම් වූ කාර්යයෙහි නියැලීම පිළිබඳ සඳහන් කිරීම
- කුසගේ විරූපීභාවය පිළිබඳ උපහාසයෙන් පැවසීම
- තමා අත්හැර වෙනත් විරූපී තැනැත්තියක අගමෙහෙසුන් කර ගැනීමට කීම
- මෙහි වාසයෙන් පලක් නො වන බව හා තමන් කිසි දිනක ඔහුට කැමති නො වන බව දැඩි ව පැවසීම.

(ලකුණු 06යි)

(iv) පබාවතිය ගෙට වැද දොර අගුළු ලා ගත්තේ ඇයි?

කුස රජතුමා තමන් කවරෙකුදැ යි කියා ඇයගේ අතින් අල්වා ගත හොත් ඔහුගෙන් ඇය ගලවා ගැනීමට කිසිවකු සමත් නො වන බැවින්

(ලකුණු 06යි)

20

[පස්වැනි පිටුව බලන්න.

**නැතහොත්**

ගස් තුන තුලාගෙන් අලියා වැටුණු වැ    වේ
සුන් දර හාමි එතරම් පොහොසතෙක් නො    වේ
තුන් ලාහකම බිම වැඩකර දිගෙන් වැ    වේ
රන් වන් කරල් බර වී දැන් බිමට නැ    වේ

ඔහුගේ ගමට මා ගිය ඒ පළමු    ව ර
තවමත් සිතේ ඇත අමතක නොව වන    යු ර
ගේනට ගොසින් ගෙන් හුවක් තරම්    දු ර
එනවා දිටිම් මිටි බැඳ ගෙන වියළි    ද ර

දර ටික තබා සෙවණැති පලු ගසක    ය ට
පිස දම් දමා දාඩිය එන නළල    පි ට
මා එන තුරුම් සිට පෙන්වූ සිනහ    ක ට
තවමත් පෙනේ දුක් දොම්නස් අතර    ම ට

පෙර දැක නොමැති මුත් සුන්දර හාමි    වී සින්
මගෙ තොරතුරු ඇසූ හැටි හිතවතකු    ලෙ සින්
ගෙඩියක් කඩාගෙන ගෙමිදුල තැඹිලි    ග සින්
පිළිගැන්විය මට සොම්නස පිරුණු    ඇ සින්

පොල් දෙහි දොඩම් ගස් තුන හතරකි    ව ත්තේ
දුප්පත් කමයි හැම තැන ලකුණුව    ඇ ත්තේ
කෙලෙසද කියා කළ ඉණ සැලකිය    යු ත්තේ
දුන් සත පණහවත් ඔහු නැත පිළි    ග ත්තේ

ආගන්තුකව එන කෙනෙකුට පුරුදු    නැ තී
හිතවත් කමින් සැලකු යුතුකමය    සි තී
ඔහු වෙත මුදලකින් මා කළ හැටිය    තු තී
සිහි වී මගේ කම්මුල රතු පැහැය    ග තී

(i) "සුන්දර හාමි එතරම් පෝසතෙක් නො වේ" යැයි සැලකීමට කවියා දැක්වූ හේතුව කුමක් ද?

- ලාස් තුනක වපසරියකින් යුතු කුඩා ප්‍රමාණයේ කුඹුරක් වගා කිරීම.
- කුඹුරු හා හේන් ගොවිතැනින් ජීවත් වීම
- පොල්, දෙහි, දොඩම් ගස් තුන හතරකට සීමා වූ ගෙවත්ත ඔහුගේ දුප්පත්කම සංකේතවත් කිරීම

(ලකුණු 04යි)

(ii) කවියාගේ කම්මුල් රත් පැහැ ගැන්නුණේ කුමක් නිසා ද?

සුන්දරහාමිගේ ආගන්තුක සත්කාරය පිළිබඳ වරදවා වටහාගෙන ඔහුට මුදලකින් ස්තුති කිරීමට උත්සාහ කිරීම ගැන ඇති වූ ලැජ්ජාව නිසා

(ලකුණු 04යි)

[ හයවැනි පිටුව බලන්න.

(iii) සුන්දර ගාමිගේ අව්‍යාජත්වය හා සරලබව පෙන්වීම සඳහා කවියා යොදා ගන්නා සිද්ධි හා අවස්ථා තුනක් ලියන්න.

- නොහඳුනන අයෙකු නමුත් ළෙන්ගතුකමින් යුතු ව පිළිගැනීම
- තැඹිලි ගෙඩියකින් නිර්ලෝභී ව සංග්‍රහ කිරීම
- තැඹිලි ගෙඩිය සඳහා ලබා දුන් මුදල ප්‍රතික්ෂේප කිරීම
- තමන් ට අවශ්‍ය වියළි දර අවටින් සොයා ගෙන ඒම

(ආදි අවස්ථා හෝ සිද්ධි තුනක් දක්වා තිබිය යුතු ය.)

(ලකුණු 06යි)

(iv) 'ආගන්තුක සත්කාරය' කවි පන්තිය මගින් කවියා ගම්වැසියන් පිළිබඳ දක්වන ආකල්පය පැහැදිලි කරන්න.

- සරල බව
- අව්‍යාජ බව
- දුක් දොම්නස් මැද වුව සිනාසීමට සමත් බව
- ආගන්තුක සත්කාරයෙහි ළැදි බව
- ආගන්තුක සත්කාරය මුදලින් තක්සේරු නොකිරීම.

(ලකුණු 06යි)

20

* *

[අනෙක් පිටුව බලන්න.

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**47 | S | I, II**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2023(2024)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2023(2024)**
**General Certificate of Education (Ord. Level) Examination, 2023(2024)**

| | |
|---|---|
| සිංහල සාහිත්‍ය රසාස්වාදය | I, II |
| இலக்கிய நயம் சிங்களம் | I, II |
| Appreciation of Sinhala Literary Texts | I, II |

## සිංහල සාහිත්‍ය රසාස්වාදය - II පත්‍රය

※ පළමුවන ප්‍රශ්නය ද, 2, 3, 4, 5 ප්‍රශ්නවලින් තෝරාගත් ප්‍රශ්න දෙකක් ද ඇතුළු ව ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.

※ මෙම පත්‍රය සඳහා පිළිතුරු සැපයීමට පිළිතුරු ලියන පොත භාවිත කරන්න.

1. පහත සඳහන් පැදි පෙළ කියවා දී ඇති කරුණු කෙරෙහි සැලකිලිමත් වෙමින් රසාස්වාදයක් ලියන්න.

සිය තමා ගනී ඈ
සිහින් රනැගිලි සටලවා ගනී,
සතියකට පෙර ගෙනා විර
විලිබරය මගෙ රන්වන් මනාලිය.

දැල් තිර අස්සෙන්
පෙනෙයි ඈ
ඔබ යනු මොබ එනු
පට පිළී ගෙන අබරණ පෙට්ටි ගෙන.

ඇසෙයි නොපෙනෙන විටත්
සාලයෙන් කාමරයට
කාමරයෙන් සාලයට
යන පා හඬ

මා වෙත එතත් ඈ
වුවමනාවක් කියත් නැතිවද
නො රැඳෙයි, පලා යෙයි.

ගැ විලුවුනෙයි,
නැත, රන්වන් සමෙහි
හෙළන සුස්මෙහි සුවඳය ඒ
ඈ බඳ සුවඳ
දැනෙන්නෙ මට විතර ද?

පෙනෙයි ඈ
ඇසෙයි
දැනෙයි
මට ගේ හැම තැන.

- මෙම පැදි පෙළට පාදක වූ අත්දැකීම
- අලුත ගෙනා මනාලියකගේ චර්යා නිරූපණය සඳහා කවියා යොදා ගත් සිද්ධි හා අවස්ථා
- මෙම පද්‍ය පන්තියේ භාෂා භාවිතය
- භාවිත පද්‍ය ආකෘතිය
- මෙම පද්‍ය නිර්මාණයේ සාර්ථකත්වයට හේතු වී ඇති කරුණු (ලකුණු 06 × 5 = 30යි)

[අවමැනි පිටුව බලන්න.

## 11 පත්‍රය

1.

- **මෙම පැදි පෙළට පාදක වූ අත්දැකීම**

මෙම පැදිපෙළට පාදක වූ අත්දැකීම වනුයේ අලුත විවාහ වූ තරුණයෙකු තම මනාලිය පිළිබඳ දක්වන හෘදයංගම බැඳීම පිළිබඳ විස්තර කිරීමයි.
(උපුටා ගැනීම් නැතත් අත්දැකීම විස්තර කර ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න )

***(ලකුණු 06යි)***

- **අලුත ඉගනා මනාලියකගේ චර්යා නිරූපණය සඳහා කවියා යොදා ගත් සිද්ධි හා අවස්ථා**

❖ හිස නමා ගති ඇ - ලැජ්ජාශීලී බව

❖ සිහින් රතැඟිලි පටලවා ගති - මනාලියගේ ළඳ බොළඳ බව, ලාලිත්‍යය

❖ පටපිළී අබරණ පෙට්ටි ගෙන - නව නිවසකට පැමිණි මනාලිය තම ඇඳුම් පැලඳුම්, ආභරණ සුදුසු පරිදි ඒ ඒ තැන්වල තැන්පත් කරන අවස්ථාව

❖ මා වෙත එතත් ඇ - තරුණයා අසලට නිතර පැමිණෙයි, නමුත් ඉක්මනින් පිට වී යයි, නුහුරු බව / ආගන්තුක බව / ලැජ්ජාශීලී බව

***විස්තරයට ලකුණු 03යි.***
***උදාහරණවලට ලකුණු 03යි.***
***(ලකුණු 03 +03 = 06යි)***

- **මෙම පද්‍ය පන්තියේ භාෂා භාවිතය**

❖ සජීවී ගුණයෙන් යුතු බස්වහරක් යොදා ගැනීම

උදා : "හිස නමා ගති ඇ
සිහින් රතැඟිලි පටලවා ගති"

❖ කෙටි වැකි භාවිතය

උදා : පෙනෙයි ඇ
ඇසෙයි
දැනෙයි

❖ අනුප්‍රාසවත් බස් වහරක් යොදා ගැනීම

උදා :

"ඔබ යනු මොබ එනු"

"සාලයෙන් කාමරයට
කාමරයෙන් සාලයට"

"නොරඳෙයි පලා යයි "

"ඇසෙයි
දැනෙයි "

***විස්තරයට ලකුණු 03යි.***
***උදාහරණවලට ලකුණු 03යි.***
***(ලකුණු 03 +03 = 06යි)***

- **භාවිත පද්‍ය ආකෘතිය**

  මේ සඳහා කවියා භාවිත කර ඇත්තේ නිසඳැස් කාව්‍ය ආකෘතියයි. ජී.බී සේනානායක මෙම පද්‍ය ආකෘතිය හඳුන්වා දීමෙහි පුරෝගාමී වී ඇත. මෙය සිවුපද ආකෘතිය, එළිසමය හා ඡන්දසට සීමා නොවූ නිදහස් ආකෘතියකි.

  "හිස නමා ගති ඈ
  සිහින් රතැඟිලි පටලවා ගති
  සතියකයට පෙර ගෙනා වර
  විළිබර ය මගෙ රන්වන් මනාලිය "

  **(එක් උදාහරණයක් සහිත ව ප්‍රමාණවත් පිළිතුරක් ලබා දී ඇත්නම් සම්පූර්ණ ලකුණු පිරිනමන්න.)**
  ***(ලකුණු 06යි)***

- **මෙම පද්‍ය නිර්මාණයේ සාර්ථකත්වයට හේතු වී ඇති කරුණු**

  ❖ චිත්ත රූප මැවෙන ආකාරයෙන් භාෂාව භාවිත කිරීම

  උදා :
  "හිස නමා ගති ඈ"

  "දැල් තිර අස්සෙන්
  පෙනෙයි ඈ"
  "නොරඬෙයි, ලායෙයි "

  ❖ සජීවී ලෙස අත්දැකීම් හා සිද්ධි නිරූපණය

  උදා :

  "හිස නමා ගති ඈ"

  "සාලයෙන් කාමරයට

  කාමරයෙන් සාලයට "

  "නොරඬෙයි, පලායෙයි "

  ❖ අලුත ගෙනා මනාලියකගේ චර්යාව යථාර්ථවත් ලෙස නිරූපණය කිරීම
  උදා :
  "සිහින් රතැඟිලි පටලවා ගති"

  "විළිබරය මගෙ රන්වන් මනාලිය"

  "ඔබ යනු මොබ එනු

  පටපිළි අබරණ පෙට්ටි ගෙන "

  "නොරඬෙයි පලා යෙයි "

*විස්තරයට ලකුණු 03යි.*
*උදාහරණවලට ලකුණු 03යි.*
*(ලකුණු 03 +03 = 06යි)*

❖ **ප්‍රශ්න පත්‍රයේ සඳහන් පිළිවෙළට ම අනුමාත්‍රකා යටතේ පිළිතුරු සැපයීම අවශ්‍ය නො වේ. පද්‍ය පන්තිය මැනවින් ග්‍රහණය කර තමන්ට අභිමත පරිදි සාර්ථක පිළිතුරු සැපයීමක් වෙනුවෙන් වූ ලකුණු ප්‍රදානය කිරීම සුදුසු ය.**

**2.** 'තුංමංහන්දිය' නවකතාවේ සිරිසේනට තම අනාගතය ගොඩනගා ගැනීම් සඳහා ඔහුගේ පවුලෙන් සහ ගමෙන් ලද සහාය කෙබඳු වී දැයි නිදසුන් **තුනක්වත්** දක්වමින් සාකච්ඡා කරන්න. (ලකුණු 15යි)

❖ ලොකු මාමා කලා කටයුතුවල නිරත වන ආකාරය දැකීමෙන් සහ එම කටයුතුවලට සහාය වීමෙන් තම හැකියා දියුණු කර ගැනීමට අවස්ථාව ලැබීම

උදා :
"අප්පා පුතාට ඕව දැම්ම බෑ ඇඟිල්ල කැපෙයි. බලාගෙන ඉඳලා ඉගෙන ගන්ඩ."

"මාමා කවකටුවත් රූලත් ගෙන එය පුරා ම මෝස්තරයක් ඇඳී."

❖ ගමේ චිත්‍ර හා කැටයම් නිර්මාණය ආදි කලා කටයුතු සඳහා සිරිසේනගේ සහාය ලබා ගැනීම.

උදා :

තේ කඩයේ පාන් පෙට්ටිය තබන බාර් එකේ තීන්ත ගෑමට යසවතී නැන්දා සිරිසේනගෙන් සහාය ලබා ගැනීම

"මල්ලියෙ මට වෙසක් කාට් දෙක තුනක් ඇඳලා දෙනව ද ?"

❖ ජයසිංහ මහතා පාසලේ ආකෘතිය නිර්මාණය සඳහා සිරිසේනට පැවරීම.

උදා : "සිරිසේන පින්සලය අල්ලපු හැටියෙන් ම පේනව මිනිහා මේ වැඩේට දක්ෂ බව "

❖ විජේරත්න ගුරුතුමා පාසල් කාලයෙන් පසුව සිරිසේනට චිත්‍ර ඉගැන්වීම.
❖ සිරිසේන ව ටෙක්නිකල් කොලිජියට යැවිය යුතු බවට විජේරත්න මහතා උපදෙස් ලබා දීම.
❖ ලොකු මාමා තම වැටුපෙන් කොටසක් සිරිසේනගේ ඉගෙනීමේ කටයුතු සඳහා යෙදවීම.

❖ **ඉහත අවස්ථා අතරින් සුදුසු උදාහරණ තුනක් ඇතුළත් වන සේ පිළිතුරු සපයා තිබීම ප්‍රමාණවත් ය. අදාළ උද්ධෘත ඒ අයුරින් ම උපුටා ගැනීමෙන් තොර ව ශිෂ්‍යයාගේ වචනයෙන් විස්තර කර තිබුණ ද සම්පූර්ණ ලකුණු පිරිනමන්න.**

***අදාළ උදාහරණ සඳහා එක් උදාහරණයකට ලකුණු 02 බැගින් ලකුණු 06යි. (02 x 3 = 06යි)***
***මැනවින් විග්‍රහ කර ඇත්නම් ලකුණු 06යි. (02 x 3 = 06යි)***
***භාෂා නිරවද්‍යතාව සඳහා ලකුණු 02යි.***
***නියමිත වචන සංඛ්‍යාව (වචන 150) සහිත ව ප්‍රමාණවත් පිළිතුරක් සපයා ඇත්නම් ලකුණු 01යි.***
***(ලකුණු 06 +06+02+01 = 15ය***
***(ලකුණු 15යි)***

❖ ***මෙහි දක්වා ඇති උදාහරණවලට අමතර ව වෙනත් උදාහරණ දක්වා සැපයූ පිළිතුරු සඳහා අදාළ ලකුණු ප්‍රදානය කරන්න.***

**3.** එදිනෙදා අත්දැකීම් සහ සිතුම් පැතුම් නිරූපණය කරමින් කාව්‍ය නිර්මාණයට පැරැන්නන් දැක් වූ සමත්කම නිර්දිෂ්ට ජනකවි ඇසුරෙන් නිදසුන් **තුනක්වත්** දක්වමින් ඇගයීමට ලක් කරන්න. (ලකුණු 15යි)

- වී ගොවිතැන වැනි ජීවන වෘත්තීන්ට අදාළ එදිනෙදා අත්දැකීම් නිරූපණය කිරීම

    ➢ ගොයම් කැපීම

උදා : "රිදියෙන් තනලා රත්රන් ඔබලා ... "
"කෙතට කෙතක් නැත මෙහෙම කෙතක් නැත ..."

- ආදරය, ප්‍රේමය, අපේක්ෂාසහගත බව වැනි සිතුම් පැතුම් නිරූපණය

උදා :
"කළුගෙ නගා මෙහි එදෝ නොඑදෝ ... "
"මට පිටුපා ගෙට යනවද සුරතලියේ ... "
"අල්ලා ගෙන නෙරිය අතකින් කිම් ද නගෝ ... "

❖ **මෙවැනි කරුණු සහිත ව උදාහරණ තුනක්වත් ඉදිරිපත් කරමින් සවිස්තරාත්මක පිළිතුරක් ලබා දී තිබිය යුතු ය . මෙයට අමතර නිර්දිෂ්ට උදාහරණ දක්වමින් සපයන ලද පිළිතුරු සඳහා අදාළ ලකුණු ප්‍රදානය කළ යුතු ය.**

*අදාළ උදාහරණ සඳහා එක් උදාහරණයකට ලකුණු 02 බැගින් ලකුණු 06යි. (02 x 3 = 06යි)*
*මැනවින් විග්‍රහ කර ඇත්නම් ලකුණු 06යි. (02 x 3 = 06යි)*
*භාෂා නිරවද්‍යතාව සඳහා ලකුණු 02යි.*
*නියමිත වචන සංඛ්‍යාව (වචන 150) සහිත ව ප්‍රමාණවත් පිළිතුරක් සපයා ඇත්නම් ලකුණු 01යි.*
*(ලකුණු 06 +06+02+01 = 15ය*
*(ලකුණු 15යි)*

4. ශාසනයෙහි උකටලී වූ භික්ෂුවක් සහමඟට යොමු කරවීම අරභයා බුදුන්වහන්සේ විසින් ගන්නා ලද ක්‍රියා පිළිවෙළ නන්ද මහ තෙරුන් වහන්සේගේ වස්තුව ඇසුරෙන් නිදසුන් තුනක්වත් දක්වමින් පහදන්න. (ලකුණු 15යි)

- නන්ද තෙරුන් වහන්සේ සිවුරු හැරීමට තීරණය කළේ ද නැද්ද ? යන්න විමසා තහවුරු කර ගැනීම

  උදා : "සැබෑ ද නන්දයෙනි, භික්ෂූන්ට මෙබන්දක් කිවුදැ යි විචාරා ..."

- එසේ සිවුරු හැරීමට හේතුව නන්ද තෙරුන්ගේ වචනවලින් ම අසා තහවුරු කර ගැනීම
  උදා : "නන්දයෙනි සිවුරු හරණේ කුමක් නිසා ද? "

- ජනපද කල්‍යාණිය පිළිබඳ ප්‍රේමය සහ වහා නැවත එන ලෙස ඇය කී බස සිතෙන් අත්හැර ගත නොහැකි වූ නන්ද තෙරුන් සිවුර හැර යන්නට තීරණය කළ විට නන්ද තෙරුන් ව දෙව්ලොවට ගෙන ගොස් දෙවඟනන් පෙන්වා ජනපද කල්‍යාණිය කෙරෙහි තිබූ ආශාව අත්හැර වීම.

  උදා : " එසේ වී නම් නන්දයෙනි, ශාසනාභිරතිය ඇතිව සිල් රක්ෂා කළේ නම් කෙලෙසුන් ගෙවා ගන්ට නුවූවොත් දෙව්ලොව ඉපද දෙවඟනන් ලබන තියාවට මම ඇපයෙමි "

- අර්හත් ඵලය ලබා ගැනීම සඳහා ධ්‍යාන වැඩීමට පෙලඹවීම

  උදා : "ගම්භීරාරණ්‍ය, රුක් මුල්, ගල්පාවුළු, කඳුරැලි, ගල්ගුහා, සොහොන, අබ්වස යනාදියට එළඹ .."

- බුදුන්වහන්සේගේ ආශ්චර්යය සහ උපක්‍රමශීලී බව නිසා අවසානයේ නන්ද තෙරුන් නිවන් මගට යොමු කරවීම
  උදා : "එක් තරම් දෙයක ඇවිටි ඇත්තවුන්ට වැඩියුරු දෙයක් පැලා ඇවිටි කළ එක් තරම් දෙයෙහි ඇවිටි හරවන්නා සේ දනවු කලණ බිසවුන් කෙරෙහි කළ ඇවිටිය දෙව්ලොවට ගෙන ගොසින් දෙවඟනන් පැලා අරවා ලූ සේක. මේ අනික් කාට පිළිවන්දැයි යන කථාවය ".

❖ **මෙවැනි සුදුසු උදාහරණ තුනක් සහිත ව පිළිතුරු ලබා දීම ප්‍රමාණවත් ය.**

❖ **අදාළ උද්ධෘත ඒ අයුරින් ම උපුටා ගෙන නොමැති වුව ද ශිෂ්‍යයාගේ වචනයෙන් විස්තර කර ලියා ඇත්නම් සම්පූර්ණ ලකුණු පිරිනමන්න .**

*අදාළ උදාහරණ සඳහා එක් උදාහරණයකට ලකුණු 02 බැගින් ලකුණු 06යි. (02 x 3 = 06යි)*
*මැනවින් විග්‍රහ කර ඇත්නම් ලකුණු 06යි. (02 x 3 = 06යි)*
*භාෂා නිරවද්‍යතාව සඳහා ලකුණු 02යි.*
*නියමිත වචන සංඛ්‍යාව (වචන 150) සහිත ව ප්‍රමාණවත් පිළිතුරක් සපයා ඇත්නම් ලකුණු 01යි.*
*(ලකුණු 06 +06+02+01 = 15ය*
*(ලකුණු 15යි)*


[ Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers! ]

**5.** 'වැලපීම කෙටිකතාව මගින් කතුවරයා සමකාලීන සමාජය තියුණු විවේචනයට ලක් කරයි.' මෙම ප්‍රකාශය නිදසුන් **තුනක්වත්** දක්වමින් විමසන්න. (ලකුණු 15යි)

- අනෙකා වෙනුවෙන් ඉවසීමට මිනිසුන්ට හැකියාවක් හෝ අවකාශයක් නොමැති ආකාරය

  උදා :

  "වාහනයක් තුළින් රියකරුවෙක් ඔහුට සාප කරයි."

  "පාර හරහා ගමන් කළ මගියෙක් තමාගේ උරහිස අශ්වයාගේ නාසයෙහි හැපුණෙන් අශ්වයා වෙත වියරු බැල්මක් හෙළා "

- ඉයෝනා වැනි අසරණ පුද්ගලයන් සමච්චලයට ලක් කරන ආකාරය

  උදා :
  "නාකි රාළ උඹේ තොප්පියේ හැටි"
  "ඒයි වධකයා, උඹට ඇහුණද, උඹේ බෙල්ල කඩනවා. උඹට ඕනවට වැඩිය සලකන්න ගියොත් අපිට පයින් යන්නයි වෙන්නේ."

- විනෝදය සඳහා මුදල් වැය කරන නමුත් අසරණ පුද්ගලයන්ගෙන් ලබා ගන්නා සේවා සඳහා ප්‍රමාණවත් මුදලක් නොගෙවීම

  උදා : "වස්කාත් මාත් බ්‍රැන්ඩි බෝතල් හතරක් ම හිස් කළා."
  "අපි තුන්දෙනාටම ග්‍රිවෙනික් දෙකක් දෙන්නම්. ග්‍රිවෙනික් දෙක ගමනට නොසෑහේ "

- පුද්ගල තරාතිරම, මිලමුදල් වැනි සාධක අනුව වෙනස් ලෙස සැලකීම. / පන්ති භේදය

  උදා : "උඹ මැරිලද බොල නාකියෝ? පාර බලාගෙන පලයන්"
  "මුන්නැහෙලා සෙල්ලක්කාර තරුණ මහත්තුරු"

- ඉයෝනා වැනි පුද්ගලයන්ගේ දුකට සංවේදී වන කිසිවකු නො සිටීම

  උදා :

  තරුණයන් තිදෙනා, හමුදා නිලධාරියා, ගෙවල් මුරකරු, වතුර බීමට නැගී සිටි තරුණයා හෝ ඉයෝනාට සවන් නොදුන් ආකාරය සහ තිරිසන් සතෙකුට මිනිසෙකුගේ දුක ප්‍රකාශ කිරීමට සිදු වීම.

  "ඉයෝනා තුළ ඇත්තේ උසුලා ගත නොහැකි ශෝකයකි. ඔහු කුඩා අශ්වයාට මුළු කතාව ම කියයි."

❖ **මේ අයුරින් සුදුසු උදාහරණ තුනක් සහිත ව සමාජය විවේචනයට බඳුන් වන ආකාරය විස්තර කර තිබීම ප්‍රමාණවත් ය.**

❖ **අදාළ උද්ධෘත ඒ අයුරින් ම උපුටා ගෙන නොමැති වුවත් ශිෂ්‍යයාගේ වචනයෙන් විස්තර කර ලියා ඇත්නම් සම්පූර්ණ ලකුණු පිරිනමන්න .**

*අදාළ උදාහරණ සඳහා එක් උදාහරණයකට ලකුණු 02 බැගින් ලකුණු 06යි. (02 x 3 = 06යි)*

*මැනවින් විග්‍රහ කර ඇත්නම් ලකුණු 06යි. (02 x 3 = 06යි)*

*භාෂා නිරවද්‍යතාව සඳහා ලකුණු 02යි.*

*නියමිත වචන සංඛ්‍යාව (වචන 150) සහිත ව ප්‍රමාණවත් පිළිතුරක් සපයා ඇත්නම් ලකුණු 01යි.*

*(ලකුණු 06 +06+02+01 = 15ය*

*(ලකුණු 15යි)*

PAST PAPERS WIKI

WWW.PastPapers.WiKi



[ Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers! ]

LOL.lk
BookStore

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න






කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර | A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් | School Book ගුරු අතපොත්

PADANAMA PUBLICATION | pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | සුභාරා

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර, කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න